දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය - 2014 පෙබරවාරි/මාර්තු
Bachelor of Arts Degree (External) Part I Examination - February/March 2014

සවිසා 2.2 - සමාජ විද්‍යාත්මක ක්‍රම
SGYG 2.2 - Sociological Methods

කාලය පැය තුන යි

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. (අ) කොටසින් ප්‍රශ්න තුනක් ද (ආ) කොටසින් ප්‍රශ්න හතරක් ද ඇතුලත් වනසේ ප්‍රශ්න හත (07) කට පිළිතුරු සැපයිය යුතුය.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

(අ) කොටස (මෙම කොටසින් ප්‍රශ්න තුනක් පමණක් තෝරාගත යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 ක් හිමිවේ.

01. පර්යේෂණයක් යනු කුමක් දැයි හඳුන්වා විද්‍යාත්මක පර්යේෂණයක දී අනුගමනය කරන ප්‍රධාන පියවරයන් විමර්ශනාත්මකව පැහැදිලි කරන්න.

02. දත්ත වර්ගීකරණයන් පෙන්වා දී සමාජ කරුණු සහ සමාජ සංසිද්ධීන් අධ්‍යයනය කිරීමේ දී ප්‍රාථමික දත්ත භාවිත කිරීමේ සුවිශේෂී ප්‍රයෝජන නිදසුන් ඇසුරින් පරීක්‍ෂා කරන්න.

03. සමීක්‍ෂණ සැලැස්ම නිර්වචනය කර සමාජ විද්‍යාත්මක පර්යේෂණවල දී සමීක්‍ෂණ ක්‍රමය භාවිත කිරීමේ ප්‍රයෝජන සහ සීමා සංසන්දනාත්මකව විශ්ලේෂණය කරන්න.

04. නියැදීම (Sampling) පැහැදිලි කර සමාජ විද්‍යාත්මක පර්යේෂණවල දී සරල සසම්භාවී නියැදි ක්‍රමය භාවිතයට ගැනීමේ ප්‍රයෝජන සාකච්ඡා කරන්න.

05. දත්ත සැකසීමේ සහ විශ්ලේෂණ (Data Processing and Analysis) ක්‍රියාවලිය හඳුන්වා එහි ප්‍රධාන පියවරයන් විස්තර කරන්න.

(ආ) කොටස (මෙම කොටසින් ප්‍රශ්න හතරක් පමණක් තෝරාගත යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් හිමිවේ.

06. සමාජ විද්‍යාත්මක පර්යේෂණ සඳහා යෝග්‍යය උපන්‍යාස (Hypothesis) පහක් ලියා දක්වන්න.

07. සමාජ විද්‍යාත්මක විෂය ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ ගැටලු පහක් ලියන්න.

08. සහභාගිත්ව සිතියම්කරණය (Participatory Mapping) හඳුන්වන්න.

09. අත්හදාබැලීමේ පර්යේෂණ සැකෙවින් පැහැදිලි කරන්න.

10. පර්යේෂණ සිදුකිරීමේ අරමුණු පැහැදිලි කරන්න.

11. සහභාගී නිරීක්‍ෂණ ක්‍රමය හඳුන්වන්න.